# කන්යාර් කෝවිල් නටබුන්

**උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්නකන්ඩාල් ග්‍රාමනිලධාරී වසමේ පිහිටා ඇත.**

ඒ - 9 මාර්ගයේ මාන්කුලම හන්දියෙන් වමට හැරී මුලතිව් මාර්ගයේ ඔඩ්ඩුසාන් හන්දියෙන් පුදුකුඩුඉරිප්පු මාර්ගයේ කිලෝමීටර් 12.5 ක් පමණ ගමන් කළ විට හමුවය 641 හමුදා මූලස්ථානය පිහිටි හන්දියෙන් වමට හැරී කිලෝමීටරයක් පමණ ගිය විට කන්‍යාර්කෝවිල්කුලම් වැවට දකුණු පසින් මෙම ස්ථානය පිහිටා ඇත.භූගෝලීය දත්ත ක්‍රමාංකය 9.246074° හා 80.680449° වේ.

අනුරාධපුර යුගයට අයත් ආරාමික සංකීර්ණයක් වන මෙහි ස්තූප ගොඩැල්ල, පිළිමගෙය පැහැදිළිව හඳුනාගත හැකිය. පිළිම ගෙයි කොරවක්ගල් 2 ක, සඳකඩ පහන හා මුරගල් පාදා පියගැට පෙළක් සකස් කර ඇත. මුරගලෙහි ඉහළ කොටස් කඩාබිඳ දමා ඇත. භූමියේ වන ගඩොලින් නිර්මිත ස්තූප ගොඩැල්ල නිධන් සොරුන්ගේ ග්‍රහනයට ලක්න ඇත. මතුපිට නිරීක්ෂණයෙන් ශිලා ස්ථම්භ සහිත ගොඩනැගිලි 06 ක් පැහැදිළිවම හඳුනාගත හැකිය. භූමියේ ගොඩනැගිලි සාධක ගිණිකොණ දිශාවට විහිද පවතී. ගොඩනැගිලි 4ක් පමණ මැදි කොට ඒ වටා ප්‍රාකාර බැම්මක් තිබූ පවට තැනින් තැන මතුව ඇති ප්‍රාකාර බැම්මේ සාධක වලින් පැහැදිළි වේ. අනුරාධපුර යුගයේ ආරමික ගොඩනැගිලි වල පූජනීය ගොඩනැගිළි සාමාන්‍යයෙන් ප්‍රාකාර බැම්මකින් වටවූ මාලකයක් මත පිහිටයි. මෙහි වන්නේ ද එම වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයම වේ.



ස්තූප ගොඩැල්ල



ස්තූප ගොඩැල්ල මධ්‍යය නිදන් සොරුන්ගේ ග්‍රහනයට ලක්ව ඇති අයුරු



පිළිමගෙය ලෙස හඳුනාගත හැකි ගොඩනැගිල්ලෙහි පිවිසුම ඉදිරිපසින්



පිළිමගෙය ලෙස හඳුනාගත හැකි ගොඩනැගිල්ලෙහි පිවිසුමෙහි පැති පෙණුම





මුරගල්

ශිලා ස්ථම්භයන්හී ඇති ගල්කටු ලක්ෂණ අනුරාධපුර යුගය නියෝජනය කරයි. එක් නටබුන් ගොඩැල්ලක් සමීපයේ කැටයම් රහිත වැසිකිලි ගලක් ද දක්නට ලැබේ. මෙම පරිශ්‍රයේ ඊසාන දෙසට තවත් ගොඩනැගිලි සාධක ඇති බවට අනුමාන කළ හැකිය. භූමිය පුරාම විවිධ ප්‍රමාණයේ වහල සෙවිලි කළ අනුරාධපුර අවධියට අයත් උළුකැට විශාල වශයෙන් විසිර පවතී. විධිමත් ගවේෂණයක් හා කැණීම් සංරක්ෂණය කළයුතු ඉතාමත් වැදගත්වූ ස්ථානයකි. පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජිත භූමියකි.



කැටයම් රහිත වැසිකිලි ගල





ගොඩනැගිලි නටබුන්



උළුකැට